SriLankan Catering

ශ්‍රී ලංකන් කේටරින් සමාගම, ශ්‍රී ලංකන් ගුවන් සමාගමට පූර්ණ හිමිකම් සහිත අනුබද්ධිත සමාගමක් වන අතර, ISO 9001:2015, ISO 22000:2018 (HACCP), ISO 14001:2015, යන තත්ව සහතික හිමිකරගෙන ඇති ජාත්‍යන්තර සහ දේශීය සම්මාන රැසකින් පිදුම් ලැබූ ගුවන් යානා සඳහා ආහාර පාන සේවා සැපයුම් කරන ශ්‍රී ලංකාවේ පිහිටි එකම සමාගමයි. කාර්යක්ෂම හා දක්ෂතා වලින් පිරිපුන් කාර්ය මණ්ඩලයකින් සැදුම්ලත් අප සමාගමේ පහත තනතුර සඳහා සුදුසුකම් ඇති පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබයි.

## වායු සමීකරණ සහ ශීතකරණ කාර්මික ශිල්පී
## AC & REFRIGERATION TECHNICIAN

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද:-**

- පිළිගත් ආයතනයකින් ශීතකරණ සහ වායු සමීකරණ ශිල්පය පිළිබඳ වසර 03ක පූර්ණ කාලීන පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම අනිවාර්ය වේ.
- අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක් හෝ ඊට වැඩි වෘත්තීය පළපුරුද්දක් තිබීම.
- සියළුම ශීතකරණ සහ වායු සමීකරණ පද්ධති හා උපකරණ, ශීතාගාර, AHU, විදුලි සම්ප්‍රේෂණ පද්ධති පිළිබඳ මනා දැනුමක් තිබීම.
- අ.පො.ස. (සා/පෙළ) ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයන් ඇතුළුව විෂයන් හයක් සමත්ව තිබිය යුතුය.

## විදුලි කාර්මික ශිල්පී
## ELECTRICAL TECHNICIAN

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද:-**

- පිළිගත් ආයතනයකින් Power Electrical හෝ Electronic වසර 03ක පූර්ණ කාලීන පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.
- අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක් හෝ ඊට වැඩි පළපුරුද්දක් තිබීම.
- Kitchen / Laundry Equipment අළුත්වැඩියා කටයුතු පිළිබඳ දැනුම සහ සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.
- අ.පො.ස. (සා/පෙළ) ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයන් ඇතුළුව විෂයන් හයක් සමත්ව තිබිය යුතුය.

## තාක්ෂණික ශිල්පී (වෑද්දුම්කරණය / ජලනල කාර්මික ශිල්පය)
## GENERAL TECHNICIAN (WELDER/ PLUMBER)

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද:-**

- පිළිගත් ආයතනයකින් වෑද්දුම්කරණය (Welder) හෝ ජලනල කාර්මික ශිල්පය (Plumbing) ට අදාළ අවමය වසරක පූර්ණ කාලීන පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම අනිවාර්ය වේ.
- අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක් හෝ ඊට වැඩි වෘත්තීය පළපුරුද්දක් තිබීම.
- අ.පො.ස. (සා/පෙළ) ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයන් ඇතුළුව විෂයන් හයක් සමත්ව තිබිය යුතුයි.

**මෙම තනතුර සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා ආහාරපාන, නිල ඇඳුම්, ගමන් පහසුකම් සහ ආකර්ශණීය වැටුප් තල ඇතුළු තවත් පහසුකම් රැසක් හිමිවන අතර සේවා මුර ක්‍රමය අනුව රාජකාරි කළ යුතුය.**

**ඉහත සුදුසුකම් සපුරා ඇත්නම් ඔබගේ අයදුම්පත, මෑතකදී ලබාගත් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් සමඟ ඔබගේ දුරකථන අංක සහ අනෙකුත් විස්තර සහිතව සහතික කිරීම සඳහා ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ලිපිනයන් සහ දුරකථන අංක ද සහිතව දින 10 ක් ඇතුළත පහත ලිපිනයට හෝ ඊ මේල් ලිපිනයට යොමු කරන්න.**

**අයදුම්කරන තනතුර ලියුම්කවරයේ හා අයදුම්පතේ වම් පස ඉහළින් සඳහන් කරන්න.ඊ මේල් නම් විෂය (Subject) යටතේ අයදුම්කරන තනතුර යොදන්න.**

**ඉහත බඳවා ගැනීම සම්බන්ධයෙන් කිසියම් හෝ ආකාරයක බලපෑමක් සිදු කිරීම නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.**

ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මානව සම්පත් හා පරිපාලන
ශ්‍රී ලංකන් කේටරින් සමාගම
තැ.පෙ.: 07
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ
කටුනායක
Email: careers@srilankancatering.com

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED